ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : PS/PCMD/ED/04
2019 ජුනි මස 17 වැනිදා

චක්‍රලේඛ අංකය: **PS/PCMD/C/18/2019**

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් ,**
**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් ,**
**සියලුම ප්‍රධාන ලේකම්වරුන් ,**
**සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,**

**රටට සෙත්පතා සිදුකරනු ලබන සත්‍යක්‍රියා වැඩසටහන - 2019 ජුනි මස 22**

පසුගියදා සිදුවූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් විපතට පත්වූ ජනතාවට සෙත්පැතීම හා නැවත එවැනි විපතක් ලක්මාතාව හට ඇති නොවේවායි යන ප්‍රාර්ථනය ඇතිව රටට හා ජනතාවට සෙත්පැතීමේ සත්‍යක්‍රියා වැඩසටහනක් පැවැත්වීමට රජය අපේක්ෂා කරනු ලබයි.

එමඟින්, විපතට පත්වූ ජනතාවගේ මෙන්ම අනෙකුත් රටවැසියන්ගේ අවිනිශ්චිත හා නොසන්සුන් බව දුරලා මානසික සහනය උදාවී රට තුළ සාමය, සමඟිය, සංහිඳියාව හා සහජීවනය ගොඩනැගෙන පරිසරයක් බිහිකර ගැනීමට දායකත්වය ලැබෙනු ඇත.

ප්‍රහාරය හේතුවෙන් දිවි අහිමි වූ පුද්ගලයින් සිහිකිරීම මෙන්ම තුවාල ලැබූවන් හට ඉක්මන් සුවය ද ප්‍රාර්ථනා කිරීම අරමුණු කරගනිමින් ද මෙම සත්‍ය ක්‍රියාවේ යෙදීම කල යුතුය.මෙහිදී පහත පරිදි කටයුතු කිරීම සුදුසුය.

1. මේ සඳහා දිවයිනේ සමස්ත ජනතාවගේම දායකත්වය මත **සත්‍යක්‍රියා වැඩසටහනක් 2019 ජුනි මස 22 වැනි සෙනසුරාදා දින සවස 06.00 ට පැවැත්වීමට කටයුතු කළ යුතුය.**

2. එහිදී සෑම නිවසක්/ කාර්යාල පරිශ්‍රයක් ඉදිරිපිටම පහනක් දල්වා විනාඩි 10 ක පමණ කාලයක් තම තමන්ගේ ආගමික විශ්වාස අනුව ආගම සිහිකර **"ලක්මාතාවට නැවත කිසිදු ත්‍රස්ත බියක් සිදුනොවී අප සියළු දෙනා හට සාමය, සතුට, සහජීවනය සහ සෞභාග්‍යය උදාවේවායි "** යන සත්‍යක්‍රියාවක් පැවැත්වීම සිදුකළ යුතුය.මේ පිළිබඳව සියළුදෙනා දැනුවත් කිරීම පිණිස සකස් කරන ලද දැන්වීමෙහි පිටපතක් ද මේ සමඟ අමුණා එවමි.

3. මෙම සත්‍යක්‍රියා වැඩසටහන දිවයින පුරා සියලු ජනතාවම තම නිවෙස් මට්ටමින් සිදුකරලීම උදෙසා සුදුසු වැඩපිළිවෙලක් / දැනුවත් කිරීමක් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාම නිලධාරීන් මඟින් සිදුකළ යුතුය.

4. මෙම දීප ව්‍යාප්ත සත්‍යක්‍රියා වැඩසටහන සඳහා බෞද්ධ,හින්දු,කතෝලික/ක්‍රිස්තියානි සහ ඉස්ලාම් ආගමික ස්ථානයන්හි සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අදාළ ආගමික නායක/පූජකතුමන්ලාගෙන් ගෞරවයෙන් අපේක්ෂා කරමි.ඒ සඳහා, බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය, ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය සහ සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයන් විසින් අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදුකළ යුතුය.



ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

5. තවද, රටට සෙත්පතා සිදුකරනු ලබන මෙම සත්‍යක්‍රියා වැඩසටහන පිළිබඳ දීපව්‍යාප්තව මහජනතාව දැනුවත් කර සහයෝගය ලබාගතයුතු බැවින්, විද්‍යුත් හා මුද්‍රිත ඇතුළු සියලුම ජනමාධ්‍යයන් ඒ සඳහා පූර්ව පුළුල් ප්‍රචාරයක් ලබාදීමට යොදවාගැනීම ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් කළ යුතුය.

ශ්‍රී ලාංකික ජනතාවගේ බිය සැක දුරු කර ඔවුන් වෙනුවෙන් සුරක්ෂිත දේශයක් බිහිකිරීම උදෙසා සිදුකරන්නා වූ මෙම සත් කාර්යය සාර්ථක කරගැනීමට ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සළකමි.

උදය ආර්. සෙනෙවිරත්න
ජනාධිපති ලේකම්

පිටපත්:-

1. සියලුම ආණ්ඩුකාරවරුන් - තම පළාත් තුළ මෙම සත්‍යක්‍රියාව සජීවී ලෙස එදින ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නායකත්වය ලබාදීම සඳහා.

2. ලේකම් - බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය - අ.ක.ස
3. ලේකම් - ජාතික ඒකාබද්ධතා ,රාජ්‍ය භාෂා ,සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය - අ.ක.ස
4. ලේකම් - තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය - අ.ක.ස
5. ලේකම් - සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය - අ.ක.ස
6. ලේකම් - අභ්‍යන්තර, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - අ.ක.ස
7. ලේකම් - ජනමාධ්‍ය අමාත්‍යාංශය - අ.ක.ස
8. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් - ජනමාධ්‍යයන් යොදාගෙන මහජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා.